# ශ්‍රී ලංකාව සඳහා වූ ජනතා ප්‍රතිපත්ති ප්‍රකාශනය




මහජන පාර්ලිමේන්තුව

# ශ්‍රී ලංකාව සඳහා වූ ජනතා ප්‍රතිපත්ති ප්‍රකාශනය

## නීතිය සහ සමාජ භාරය විසින් සම්බන්ධීකරණය කරන ලද මහජන පාර්ලිමේන්තු කණ්ඩායම විසිනි

2023 ජූලි මස 7 වන දින

**කෙටුම්පත් සැකසීම:**
රජ්නි ගමගේ

**සංස්කරණය :**
සකුන්තලා කදිර්ගාමර්
සඳුන් තුඩුගල
අමලනී ද සෙයිරා
විදුර මුණසිංහ
සකුණ එම් ගමගේ

**කවර නිර්මාණය,කොලාජ් නිර්මාණ සහ පිටු සැකසුම:**
සංගීත් මදුරාවල | Design Calibali

**ඡායාරූප :**
සකුණ එම් ගමගේ
අමිල උඩගෙදර

**ප්‍රකාශන දායකත්වය:**

LAW & SOCIETY TRUST

නීතිය සහ සමාජ භාරය
3, කින්සි ටෙරසය,
කොළඹ 08,
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (0) 11 268 48 45
ෆැක්ස්:+94 (0) 112 268 68 43
වෙබ්: **www.lstlanka.org**



# ශ්‍රී ලංකාව සඳහා ජනතා ප්‍රකාශනය

## මහජන පාර්ලිමේන්තුව

මහජන පාර්ලිමේන්තුව වූකලී 2022 වසරේ ශ්‍රී ලංකාව තුළ ඇතිවූ දේශපාලනික, ආර්ථික හා සමාජ අර්බුදවලට ප්‍රතිචාරයක් වශයෙන් ස්ථාපනය කරන ලද සංවාදාත්මක හා පුරවැසි නායකත්වයෙන් යුත් මූලාරම්භයකි. මෙම මූලාරම්භයේ අරමුණ වූයේ රටේ විවිධ ප්‍රදේශයන්හි විවිධ ජන ප්‍රජාවන් තුළ විසිර, පැතිර සිටින පුරවැසියන් සමග කටයුතු කරමින් ඔවුන්ගේ අදහස් ලබාගැනීමයි. මෙම වසරේ ආර්ථික අර්බුදයට ප්‍රතිචාරීව ඉස්මතුවී දේශපාලනික වගවීමක් ඉල්ලා සිටි ජනතා අරගල විරෝධතා ව්‍යාපාරයන් 2022 අප්‍රේල් මස 9වන දින සිට ගාලු මුවදොර පිටියේ 'ගෝඨාගෝගම" තුළ වඩාත් නිර්මාණාත්මකව එළි දැක්විණි. ඉන් අනතුරුව තවත් ගෝඨාගෝගම විරෝධතා ස්ථානයන් බදුල්ල, ගාල්ල, කුරුණෑගල හා මහනුවර වැනි දිස්ත්‍රික්ක තුළ පිහිටුවන ලදී.

මහජන පාර්ලිමේන්තුව පුරවැසි සහභාගිත්වය සහ මහජන මතය සඳහා විවෘත හා සාකච්ඡාමය අවකාශයක් ලෙස ක්‍රියාත්මක වේ. පළමු සැසි දෙක 2022 අප්‍රේල් 12 සහ 13 යන දිනයන්හිදී කොළඹ ගෝඨාගෝගමදී පැවැත්විණි. ඉන් අනතුරුව මැයි මස 2වන දින ගාල්ලේදීද; ජුනි මස 3-6 දක්වා යාපනය, මුලතිව්, මන්නාරම, කිලිනොච්චිය හා වව්නියාවද ඇතුළත් උතුරු පළාතේ යුද්ධයේ බලපෑමට ලක්වූ සුළු ජන කොටස් සමගින්ද; ජුනි මස අග භාගයේදී උඩපුස්සැල්ලාව, නුවරඑළිය, තලවකැලේ හා මස්කෙලිය ප්‍රදේශයන්හි වැවිලි අංශයේ ජන ප්‍රජාවන් සමගින්ද; අගෝස්තු 5-8 දක්වා කාල පරිච්ඡේදය තුළ උතුරු මැද පළාතේ පොළොන්නරුව හා හිඟුරක්ගොඩ ප්‍රදේශයන්හි මෙන්ම නැගෙනහිර පළාතේ මඩකලපුව හා අම්පාර ප්‍රදේශයන්හිද ගොවි ජනතාව, යුද්ධයෙන් වැන්දඹුවන් බවට පත්වූ කාන්තාවන්, කාන්තා ක්‍රියාකාරිනියන් සහ දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන් සමගින්ද මහජන පාර්ලිමේන්තු අදහස් විමසීම් සිදුකරන ලදී. මෙකී පුද්ගල සහභාගිත්ව සැසිවල අන්තර්ගත කරුණු මුහුණු පොත, ට්විටර්, ඉන්ස්ටර්ග්‍රෑම් හා යූටියුබ් වැනි සමාජ මාධ්‍ය වේදිකාවන්හි හුවමාරු කරන මාර්ගගත ප්‍රවේශයක්ද මහජන පාර්ලිමේන්තුව සතුවේ. අර්බුදය හා ඉදිරි ගමන සම්බන්ධ මහජන අදහස් ගූගල් ආකෘති පත්‍රයක් උපයෝගයෙන් රැස් කරන ලදී.






# මහජන ලේඛන

මහජන පාර්ලිමේන්තුවේ අරමුණ වනුයේ ජනතාව මුහුණ දෙන වඩාත් පීඩනකාරී ගැටලු සහ පවත්නා ජාතික අර්බුදය ආමන්ත්‍රණය පිණිස යෝජිත ප්‍රතිසංස්කරණ හඳුනාගෙන ලේඛනගත කිරීමයි. මෙම ලේඛනයන් ඒකරාශි කරන්නාවූ දිගු කාලීන, ප්‍රායෝගික ප්‍රතිපත්ති ප්‍රකාශනයක් පහත දක්වා ඇත.

## මහජන පාර්ලිමේන්තු හමුවීම්

- 2022 අප්‍රේල් 12 සහ 13-ගෝටගෝගම ගාලු මුවදොර අත්පත් කරගත් විරෝධතා භූමිය
- 2022 මැයි 2-ගෝටගෝගම ගාල්ල දිස්ත්‍රික්කය අත්පත් කරගත් විරෝධතා භූමිය
- 2022 ජූනි 3-මන්නාරම දිස්ත්‍රික්කය (මුල්ලිකුලම් සහ සිලාවතුරේ දෙමළ සහ මුස්ලිම් ප්‍රජා කණ්ඩායම්)
- 2022 ජූනි 4-යාපනය දිස්ත්‍රික්කය (අභ්‍යන්තර අවතැන් වූවන්, ධීවර ප්‍රජාවන්, කාන්තා කණ්ඩායම්, සමුපකාර නියෝජිතයන්)
- 2022 ජූනි 5-කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්ක (යුද්ධයෙන් පීඩාවට පත් වූ සහ නැවත පදිංචි කළ ප්‍රජාවන්)
- 2022 ජූනි 22 සහ 23 වැවිලි කර්මාන්තයේ නියුතු ශ්‍රමික ප්‍රජාවන් (උඩපුස්සැල්ලාව, තලවාකැලේ සහ මස්කෙළිය)
- 2022 අගෝස්තු 05 පොළොන්නරුව දිස්ත්‍රික්කය (ක්ෂුද්‍ර මූල්‍ය ණය අර්බුදයෙන් සහ පොහොර ප්‍රශ්නයෙන් පීඩාවට පත් හිඟුරක්ගොඩ සහ ලංකාපුර ගොවි ප්‍රජාවන්)
- 2022 අගෝස්තු 07 මඩකලපුව දිස්ත්‍රික්කය (ධීවර, ගොවිතැන් සහ ගෘහ ව්‍යාපාර සම්බන්ධ තිරුප්පෙරුන්තුරේ කාන්තා ප්‍රජාවන්)
- 2022 අගෝස්තු 08 අම්පාර දිස්ත්‍රික්කය (ඉඩම් කොල්ලකෑමේ ගැටලුවලට මුහුණ දෙන පොතුවිල් සහ අක්කරපත්තු ප්‍රජාවන්)
- Facebook, twitter,Instagram ආදිය හරහා සබැඳි ප්‍රතිචාර



# 1. බහුත්වවාදී හා සමාන සමාජයක්

1.2. බලය බෙදාහැරීම, ජනවර්ග අන්තර් මුහු ප්‍රතිපත්ති ආදිය හරහා ජන ප්‍රජාවන් අතර නිර්ව්‍යාජ ප්‍රතිසන්ධානයක් සහිතව ජනවාර්ගික ගැටලුව වෙත ප්‍රවේශ වන්නාවූ ප්‍රධාන ගැටලු තුළින් දේශපාලන විසඳුමක් මතුවිය යුතුය.

1.2. නීතියේ ආධිපත්‍යය හරහා මානවාගමික, භාෂාත්මක හා සෙසු අංශයන්ගෙන් ආන්තිකකරණයට ලක්වූ ජනප්‍රජාවන්ගේ මූලික මාවන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

1.3. 'ජනවාර්ගික ගැටලුවේ ඉතිහාසය හා පූර්ණ වර්ගවාදය පිළිබඳ පුරවැසියන් වෙත අධ්‍යාපනය ලබාදීම.

1.4. වෛරී කථාවන් හා/හෝ මානවාගමික භීෂණය ඇවිලවීමට අදාළ දණ්ඩනයන් පැනවීම සඳහා සමානුපාතික වූ නෛතික ක්‍රියාමාර්ග.

1.5. අනාගමික දේශපාලනය ආයතනගත කිරීම, උදා: අන්තර් ආගමික සහ පැවැත්ම උදෙසා වූ ජනතා එක්සත් සභාව.

1.6. අයිතිවාසිකම් හා මූලික සමාජ සේවාවන් ලබාගැනීමේ හැකියාව විෂයයෙහි රටේ සියලු පුරවැසියන් වෙත නීතිය සමානව අදාළ විය යුතුය.

1.7. ජනතාව වෙත සිය හිමිකම් හා කාර්ය සම්බන්ධයෙන් අධ්‍යාපනය ලබාදීම.

1.8. භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම හා නිදහස් සහ අපක්ෂපාතී මාධ්‍ය ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම.

1.9. පොලිසිය හා සන්නද්ධ හමුදාවන් මධ්‍යස්ථ ආකාරයකින් ක්‍රියාත්මකවන අතර සිය වෘත්තීය රාමු තුළ පවත්නා බවට වගබලා ගැනීම.

# 2. යුද්ධයේ වින්දිතයන් හට හා ඓතිහාසික අසාධාරණකම් සම්බන්ධ යුක්තිය ඉටු කිරීම

2.1. සියලුම පුරවැසියන්ගේ මානව හිමිකම් ව්‍යවස්ථානුකූලව තහවුරු කරනු ලැබීම

2.2. යුද්ධයෙන් වින්දිතයන් බවට පත්වූවන්ගේ අයිතිවාසිකම් ප්‍රමුඛතාගත කරමින් ක්‍රියාවෙන් තහවුරු කිරීම

2.3. පශ්චාත්-යුධ ප්‍රදේශයන් විශේෂ කොටගෙන වර්ගවාදය ආයතනගත කරමින් රාජ්‍ය පාලනය හමුදාකරණය කරන්නාවූ රාජ්‍ය ප්‍රතිපත්ති ආපසු හැරවීම

2.4. සුළු ජන කොටස් හා දේශපාලනිකව විරුද්ධ මතධාරීන් අත්තනෝමතිකව අත් අඩංගුවට ගෙන බියගැන්වීම සඳහා භාවිත කෙරෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීම

2.5. ඉහළ සිට පහළට හා පහළ සිට ඉහළටද සාමය ගොඩනැගීමේ හා සංහිඳියා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. මෙතුළට අතීත ක්‍රියාකාරකම් සඳහා වගකීම භාරගැනීම හා යුද සමය තුළ දාමරික ක්‍රියාවන්හි නිරත වූවන්ට නඩු පැවරීමේ ඳ කාර්යය වේගවත් කිරීම ඇතුළත් වේ.

2.6. යුද්ධය හා සම්බන්ධව අතුරුදන් වූවන් පිළිබඳ තත්ත්වය නිවේදනය කොට ඔවුන්ගේ පවුල් වෙත යුක්තිය ඉටු කරමින් වන්දි ලබාදීම.




OMP
நல்வரவு
NO MORE DISAPPEARANCES
NO MORE DISAPPEARANCES
අතුරුදහන් කරවීම්
NO MORE DISAPPEARA

# 3. ජනතාවගේ හා ජනතාව උදෙසා වූ ආර්ථිකයක්

3.1. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වඩාත් පාරදෘෂ්‍ය, සහභාගිත්ව, වගවීමක් සහිත, කාර්යක්ෂම හා අපක්ෂපාතී එකක් විය යුතුය.

3.1.1 ප්‍රධාන ජාතික සංවර්ධන තීරණ වඩා ඉහළ ප්‍රචාරණයක් හා පොදුජන සහභාගිත්වයක් සහිතව ගත යුතු වේ. උදා: එය අත්‍යවශ්‍ය වන්නේද හා පුරවැසි අවශ්‍යතා එමගින් සපුරාලනු ලබන්නේද, එමගින් ප්‍රාදේශීය ජන ප්‍රජාවනට ඇතිවන බලපෑම ආදිය. වර්තමානයේ රටේ එක් එක් පළාතේ විවිධාකාර අවශ්‍යතාවනට යෝග්‍ය වන්නාවූ අත්‍යවශ්‍ය සංවර්ධන මූලාරම්භයන් ඉදිරියට ගෙනයා යුතුය; අන් සියලු මූලධන වියදම් නවතා ඒවා හදිසියේ ඉටුකළ යුතුවන දුගීබව තුරන් කිරීමේ හා සහන ක්‍රියාමාර්ග වෙත යොමු කිරීම.

3.1.2 සොරකම් කරන ලද මහජන මුදල් ආපසු ලබාග නිමින් වැරදිකරුවන් බවට හඳුනාගනු ලබන අයට එරෙහිව ශ්‍රී ලංකාවේ හෝ විදේශීය අධිකරණ කළාපයන්හි හෝ අතීතයටද බලපාන්නාවූ පරිදි නඩු පැවරීමට හැකි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

3.1.3 නිදසුනක් ලෙස ඉන්දියාවේ ආධාර් කාඩ්පත් ක්‍රමය වැනි සමාජ ආර්ථික අසමානතාවයන් අවම කරන පරිදි ජනතාව වෙත වගකීමෙන් යුතුව ඇඟවුම්කාරී ප්‍රතිපෝෂණ ලබාදෙන ප්‍රගතිශීලී හා පාරදෘෂ්‍ය බදු පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම.

3.1.4 ජාතික අභිලාෂය සමතුලනය කරමින් සුරක්ෂා කිරීමේ ක්‍රමෝපායික හැකියාවකින් යුත් විදේශීය ආයෝජන හා සංවර්ධන ව්‍යාපෘති උදෙසා රටවල් සමගින් මනා විදේශ සබඳතා පවත්වාගෙන යාම.

3.1.5 නිදසුන් ලෙස රජයේ ආයතන අධීක්ෂණය සඳහා ස්ථිර නියාමන කොමිෂන් සභාවක් පිහිටුවීම; ජාතික මට්ටමින් තීරණ ගන්නාවූ පුද්ගලයන් විසින් සුදුසුකම් ප්‍රමිතීන් සපුරාලනු ලබන බවට සහතික කරන්නාවූ නීති සම්මත කිරීම ආදී ලෙස රජයේ මුදල් පිළිබඳව වඩාත් දැඩි, නිරන්තර හා ඵලදායී විගණන, ප්‍රතිපත්ති සමාලෝචන හා දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

3.1.6 ගනු ලබන ජාතික ණය ප්‍රමාණයට පනවනු ලබන සීමාකරණයන්ද සමගින් නිල, අපක්ෂපාතී අවදානම් හා ආයෝජන මත ප්‍රතිලාභ තක්සේරුකරණයන් හා මහජන අදහස් සමීක්ෂණයන් සිදු කිරීමෙන් පසු පමණක් ජාතික මට්ටමින් ණය ගැනීමේ හැකියාව ලබාදෙන පරිදි නීති සම්මත කිරීම.




5000



# 3.2 දේශීය සංවර්ධන ප්‍රතිපත්ති ජනතා කේන්ද්‍රීය විය යුතුය

3.2.1 සමාජ ආරක්ෂණය යාන්ත්‍රණයන් තුළ ජනගහණයේ වඩාත් බලපෑමට ලක්වන්නාවූ කොටස් ප්‍රමුඛතාගත විය යුතු අතරම සමාජයේ සියලු කොටස් සමතුලනය විය යුතුය. රජයේ සහනාධාර තුළ සෞඛ්‍ය, අධ්‍යාපන හා කෘෂිකාර්මික අංශ ප්‍රමුඛතාගත විය යුතුය. සමාජ ආරක්ෂණය යාන්ත්‍රණයන් තුළ ජනගහණයේ වඩාත් බලපෑමට ලක්වන්නාවූ කොටස් ප්‍රමුඛතාගත විය යුතු අතරම සමාජයේ සියලු කොටස් සමතුලනය විය යුතුය. රජයේ සහනාධාර තුළ සෞඛ්‍ය, අධ්‍යාපන හා කෘෂිකාර්මික අංශ ප්‍රමුඛතාගත විය යුතුය.

3.2.2 ආර්ථික අර්බුද නිරාකරණ ක්‍රමෝපාය තුළ වැඩකරන පන්තිය හා සමාජයේ ආර්ථික වශයෙන් ආන්තිකකරණයට ලක්වූ අංශ මෙන්ම පරිසරයද ඉලක්කගත හා කේන්ද්‍රගත විය යුතුය.

3.2.3 පාරිභෝගික ආර්ථිකයකට වඩා ජනතා කේන්ද්‍රීය නිෂ්පාදන ආර්ථිකයකට සහාය දක්වමින් වඩාත් තිරසර, නිෂ්පාදනය පදනම් කරගත් දේශීය ආර්ථිකයක් රජයේ ප්‍රතිපත්ති තුළ ප්‍රමුඛතාගත විය යුතුය.

3.2.4 දේශීය අභිලාශයන් වඩාත් හොඳින් සපුරාලනු පිණිස සමුපකාර වැනි සාමූහික යාන්ත්‍රණ පුනර්ජීවනය කොට ස්ථාපනය කිරීම.

3.2.5 මධ්‍යම පාන්තික ව්‍යාපාරිකයන් විසින් ගොවීන් දැඩි සූරාකෑමකට ලක් නොකෙරෙන බවට ප්‍රතිපත්ති තුළ වගබලාගත යුතුය.

3.2.6 ගෝලීය ඩිජිටල් සේවා හා වේදිකාවන් වෙත ප්‍රවේශ වීම සඳහා තරුණයන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය උත්තේජනය කිරීමද ඇතුළත්ව ආර්ථික ප්‍රතිපත්ති තුළ තරුණ පිරිස් වෙත වැඩි අවස්ථාවන් ලබාදිය යුතුය.
උදා: අපනයන අංශයේ ආර්ථික ඵලදායකත්වය වැඩිදියුණු කිරීම

3.2.7 ඕනෑම ජාතික පොදු අවම වැඩසටහනක් තුළ ජීවිකාව ගෙනයාමේ හිමිකම සහතික කරමින් ජීවන වෘත්ති ජනන මාර්ග ප්‍රවර්ධනය කිරීම.

# 4. ඉඩම් අයිතිය හා ස්වභාවික සම්පත් වෙත සාධාරණ ලෙස ප්‍රවේශ වීමේ හිමිකම.

4.1 ඉඩම් නැවත බෙදාහැරීම සඳහා නිසි ක්‍රමවේදයක් ගොඩනැගීම.
4.2 ඉඩම් අයිතිය හා මුල් ප්‍රදේශ ආශ්‍රිත හිමිකම් සහතික කිරීම. උදා: පෙරදී
4.3 යුද ගැටුම් පැවති ප්‍රදේශයන්හි ජීවත්වූ ජනතාව විසින් සිය පුද්ගලික ඉඩම් තුළ හමුදාව පදිංචි වී ගොවි කටයුතු සිදු කිරීම හේතුවෙන් එම ඉඩම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව අවහිර කොට ඇති බව වාර්තා කරන ලදී.
4.4 නිරනුමානවම ප්‍රාදේශීය ජීවිකා මූලාශ්‍රයන් හා බැඳි ස්වභාවික සම්පත් වෙත සාධාරණ ප්‍රවේශ හැකියාවක් සහතික කිරීම




POLICE



# 5. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදයක්

පහත ආකාරයේ දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම:

5.1. රජයේ නිලතල හිමිකම් හා කැබිනට් අමාත්‍ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව සම්බන්ධ සීමාවන්.

5.2. දේශපාලන නියෝජිතයන් සඳහා වූ වෘත්තීය ප්‍රමිතීන්. උදා: අනිවාර්ය අධ්‍යාපන සුදුසුකම්, වයස් සීමාව, පාර්ලිමේන්තුවේ සේවය කළ හැකි උපරිම වාර සීමාවක්, ඥාති සංග්‍රහ විරෝධී ක්‍රියාමාර්ග, රජයේ නිලතල භාර ගැනීමට අපේක්ෂා කරන දේශපාලන නියෝජිතයන් විසින් යම් අතීත අවකල්ක්‍රියාවක නිරතව සිටියේද යන්න පිළිබඳ පාරදෘශ්‍යභාවය.

5.3. තෝරා පත්කරගනු ලබන නියෝජිතයන් මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයනට වගවිය යුතු වන හා නීතිමය වශයෙන් බැඳී සිටින බවට තහවුරු කරන යාන්ත්‍රණයක්.

5.4. 2015 වසරේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 19වන සංශෝධනය ප්‍රතිස්ථාපිත කොට වැඩිදියුණු කිරීම. විධායක ජනාධිපති බලතල සීමා කිරීම හෝ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ පූර්ණ පාර්ලිමේන්තු ක්‍රමයකට ආපසු ගමන් කිරීම.

5.5. බලපෑම් කණ්ඩායම් හා සෙසු ජනතා කේන්ද්‍රීය සහා මූලාරම්භයන් හරහා පොදුජන යහපත කෙරෙහි වූ රජයේ වගවීම පවත්වාගෙන යාමට පාර්ලිමේන්තුවේ විපක්ෂයට බලතල ලබාදීම.

5.6. ක්‍රියාත්මක පාර්ලිමේන්තු කාල පරිච්ඡේදයක් ඇතුළත දේශපාලන පක්ෂයන්හි මන්ත්‍රීවරුන් පක්ෂ මාරු කිරීම වළකාලීම.

5.7. තෝරා පත්කරගත් නියෝජිතයන් හා ඡන්දදායකයන් අතර අනුග්‍රාහක - සේවාදායක සම්බන්ධතා තහනම් කිරීම.

5.8. දේශපාලන පක්ෂ විගණනයට ලක්කොට මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාර මූල්‍යකරණය ඈ කරුණු සම්බන්ධයෙන් මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්මත කිරීම.

5.9. සියලු දේශපාලන නියෝජිතයන් විසින් මැතිවරණ ව්‍යාපාරයෙහි නිරතව සිටින අතර හෝ රජයේ නිලතලයනට පත් කරනු ලැබූ විට ඔවුන් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශයට පත් කිරීම නීති මගින් අනිවාර්ය කිරීම.

5.10. අත්තනෝමතික, නුසුදුසු හා අනුග්‍රහාත්මක පදනමින් සිදුකරනු ලබන පත්කිරීම් වළකාලන අයුරින් (ජාතික ලැයිස්තුවෙන් පත්වන්නන්ද ඇතුළත්ව) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නාම යෝජනා කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ සතුව සංවරණ හා තුලන යාන්ත්‍රණයන් පැවතිය යුතුය.

5.11. පසුව එකට එක කිරීම් හා වෙන්කොට සැලකීම් සිදුවනු ඇත්තේය යන බියකින් තොරව හා අදාළ ප්‍රතිපෝෂණයන් හෙවත් අදහස් සම්බන්ධයෙන් කාර්යක්ෂමව හා ස්වාධීනව කටයුතු කරනු ලබන්නේය යන සහතිකය සහිතව පුරවැසියන් හට පැමිණිලි ඉදිරිපත් කිරීම හෝ සෙසු ප්‍රතිපෝෂක ලබාදීම සිදුකල හැකිවන ඵලදායී ක්‍රම ස්ථාපනය.


PRESS
53 DIV RHQ
ARMY
HOME

# 6. අන්තර්කරණය වූ රාජ්‍ය පාලනය.

6.1. සක්‍රීය සම්බන්ධීකරණයක් සහිතව ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ආණ්ඩුකරණය තුළ වැඩි තරුණ. කාන්තා, ආබාධිත සහිත වූවන්, සුළුතර කොටස්, ගොවි ජනතා, වැඩකරන ජනතා හා ආර්ථික වශයෙන් අවාසි සහගත තත්ත්වයන්හි පසුවන සෙසු ජන ප්‍රජාවන්ගේ නියෝජනයක් පවත්වාගෙන යාම.

6.2. සංවෘත හා කුඩා කණ්ඩායම් හරහා සිදුකරන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය වෙනුවට ජනතා සම්මුතිය හා අදහස් විමසීම හරහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම.

6.3. පක්ෂ සංයුතිය කවරේ වුවද සියලු රජයන් විසින් අනුගත වන්නාවූ ජාතික ප්‍රතිපත්තියක් ගොඩනඟා එම කර්තව්‍යය ඉටු කරනු උදෙසා ඉන්දියාවේ සනාථන සභාව හෝ ජාතික රාජ්‍ය සභාවක් වැනි ආයතනයක් ස්ථාපනය කිරීම.

6.4. ආණ්ඩුකරණ කාර්යයෙහි සිවිල් සමාජයේ හා සෙසු කණ්ඩායම්වල කාර්යභාරය වර්ධනය කිරීම. අන්තර්ග්‍රහණය පිණිස එක්ව කටයුතු කිරීමේ යාන්ත්‍රණයක් සකසා ක්‍රියාත්මක මට්ටමේ ප්‍රතිඵල ලබාදීම.



# ජනතාවගේ නිර්දේශ පිළිබඳ කතන්දර

අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් හා අක්කරේපත්තුහි පැවති ජනතා පාර්ලිමේන්තු සැසියකදී මහා පරිමාණ වාණිජ කෘෂිකර්මය, පුරාවිද්‍යා කටයුතු හා වන සංරක්ෂණය මගින් ජනතාවගේ ඉඩම් පුළුල් ලෙස අත්පත් කරගෙන ඇති ආකාරය පිළිබඳ ගම්වාසීන් විසින් අදහස් දක්වන ලදී. තමා හට වර්තමාන අර්බුද තත්ත්වය කළමනාකරණය කරගැනීමට උපකාරී විය හැකි ගෙවතු වගාවන් හා කුඩා පරිමාණ නිෂ්පාදනයන් සිදු කිරීමේදී මතුවන අභියෝග පිළිබඳවද ඔවුහු අදහස් දැක්වූහ. ගොවීන්ගෙන් අඩු මිල ගණන්වලට වී මිලදී ගෙන ඉතා අධික මිල ගණන්වලට ඒවා අලෙවි කිරීමෙන් ලාභ ලබන සහල් මාෆියාවක් හා අතරමැදියන් පිරිසක් සම්බන්ධ ගැටලුව පිළිබඳ හිඟුරක්ගොඩ ගොවීහු අදහස් පළ කළහ. සම්පත්වලට සාධාරණ ප්‍රවේශ අවස්ථාවන් ලබාදෙමින් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ස්ථාවර මිල ගණන් පවත්වාගෙන යන බවට වගබලා ගැනීම රජයේ වගකීමයි. බාහිර සහල් මෝල් ව්‍යාපාරයන්හි බලය හීන කළ හැකිවනු පිණිස සුළු පරිමාණ ග්‍රාමීය සහල් මෝල් සඳහා සහාය දැක්විය යුතු බවට යෝජනා විය.

රජයේ මූලික මුදල් ප්‍රතිපාදනය (දැනට රු. 5,000 ක් ලෙස පවතින) ඉහළ නංවා එය සැබෑ ජීවන වියදම පිළිබිඹු කරන්නක් වන පරිදි ගලපන ලෙස ඉල්ලා සිටීමේ අවශ්‍යතාවය උතුරු පළාතේ ඇතැම් ජන ප්‍රජාවන් විසින් ප්‍රකාශ කරන ලදී. වර්තමාන ග්‍රාමීය දුගීබව දුරැලීමේ වැඩසටහන වන සමෘද්ධි ව්‍යාපාරයට අදාළ හා වසංගත සමය සහ අර්බුද කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද සෙසු මුදල් ප්‍රතිපාදනයන් සිය ජන ප්‍රජාවන් තුළ ජීවත්වන එම ප්‍රතිපාදනයන් අවශ්‍ය සියල්ලන් වෙත සාධාරණව බෙදා නොහරින ලද බවට උඩුපුස්සැල්ලාවේ තවත් පිරිසක් විසින් පැමිණිලි කරන ලදී.

සම්ප්‍රදායික බීජ කොම්පෝස්ට් පොහොර භාවිතයෙන් (ප්‍රදේශයේ සහල් මෝල්වලින් පිට කෙරෙන ඒවා වැනි) වගාකළ හැකිවන ආකාරයද, ඒ සඳහා බහුල වශයෙන් වාරිමාර්ග කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවයක් නොපවත්නා බවද හිඟුරක්ගොඩ, පොළොන්නරුව හා මඩකලපුව ප්‍රදේශයන්හි ගොවි ජනතාව විසින් ප්‍රකාශ කරන ලදී. මෙය වඩාත් ස්වයංපෝෂිත හා සහජීවී ක්‍රමයක් වූ අතර ඇතැම්හු සිය නිවෙස්හි මෙම බීජ සකසා ගැනීමට කටයුතු කරමින් සිටින බව පැවසූහ. මෙයට ප්‍රතිවිරුද්ධව, රජය විසින් සපයා දෙන ලද දෙමුහුන් බීජ වගා කිරීම වඩාත් දුෂ්කර වන අතර ඒ සඳහා වැඩි ජල සම්පාදනයක් හා රසායනික පොහොර යෙදීමක් අවශ්‍යවන බවද ප්‍රකාශ විය. දේශීය ආහාර ක්‍රම බරපතල ලෙස පොහොර/ බීජ සහනාධාර හා ඉන්ධන බෙදාහැරීම යන අංශයන් මත රඳා පවත්නා බැවින් හා මෙම ආර්ථික කටයුතුවල ස්වභාවය සෘතු අනුව වෙනස්වන බැවින් වගා කටයුතු හා ධීවර කටයුතුවල නිරත පුද්ගලයන් වෙත ඉන්ධන බෙදාහැරීම හා පොහොර/ බීජ සහනාධාර ලබාදීම සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවට යෝජනා විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයන්ගෙන් හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි අතිශය අසාධාරණ හා දරුණු නීති අහෝසි කිරීමෙන් තොරව සිදුකරන ඕනෑම ක්‍රමයේ වෙනසක් හුදෙක් ප්‍රදර්ශනාත්මක හා තාවකාලික එකක් පමණක් වනු ඇත්තේය යන්න උතුරේ ජන ප්‍රජාවන්ගේ දැඩි විශ්වාසය විය. 2019 පාස්කු ප්‍රහාරයන්ගෙන් අනතුරුව සිය ප්‍රජාවට එහි ප්‍රතිවිපාකයනට මුහුණ දෙන්නට සිදුවූ ආකාරය පිළිබඳව මඩකලපුව කාත්තන්කුඩිහි ප්‍රාදේශීය කාන්තා කණ්ඩායමක් විසින් අදහස් පළ කරන ලදී. වසර ගණනාවක් පුරා සිය ජන ප්‍රජා සාමාජිකයන් රඳවා තබාගැනීම සඳහා රජය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත කොට තිබිණි. සැකයට භාජනය වන පුද්ගලයා හට සිය ජන ප්‍රජාව තුළ වැඩ කටයුතු පවරා ඔවුන් විසින් උපයන වේතන ඔවුන්ගේ පවුල් වෙත යැවිය හැකිවන පරිදි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට විකල්පයක් ලෙස ප්‍රජා පාදක විශෝධනය යොදාගත හැකි බවට ප්‍රාදේශීය ජනතාව විසින් යෝජනා කරන ලදී.

විශාල වතු කම්කරු අංශයක් සහිත උඩුපුස්සැල්ලාව ප්‍රදේශයේ දිනකට රු. 1000/-ක වේතනයක් සඳහා වූ ඉල්ලීම මේ දක්වාද ඉටු කරනු ලැබ නොමැත. ඉදිකිරීම්, ත්‍රිරෝද රථ කුලී සේවා සහ ඇඟළුම් අංශයන් වැනි වැවිලි අංශයෙන් පරිබාහිර රැකියා අවස්ථාවන් වේගයෙන් වැසී යන ආකාරය පිළිබඳවද ප්‍රදේශයේ ජනතාව විසින් අදහස් දක්වන ලදී. විශ්වවිද්‍යාල උපාධිධරයනට පවා රැකියා සොයාගැනීම වඩ වඩාත් දුෂ්කර එකක් බවට පත් වෙමින් පවතී. ස්ථිර රැකියාවන් සහිත රජයේ සේවකයන්ද ඇතුළු බොහෝ ජනතාවට සිය දිවි පැවැත්ම උදෙසා (ධීවර කටයුතු වැනි) දෙවන රැකියාවක් වෙතද යොමුවීමට සිදුව ඇති ආකාරය පිළිබඳව මඩකලපුවේ කාන්තා කණ්ඩායම් විසින් අදහස් දක්වන ලදී. විනිමය මාධ්‍යයක් වශයෙන් මුදලේ වටිනාකම උද්ධමනය හේතුකොට පහත වැටී ඇති ආකාරය පිළිබිඹු කරමින් ඇතැම්හු අතිරික්ත මත්ස්‍ය තොග වෙනත් භාණ්ඩ සඳහා සෘජුවම හුවමාරු කළහ. එවැනි තත්ත්වයන්හි සමාජීය ප්‍රතිවිපාක මානසික සෞඛ්‍ය ආබාධ සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතයන් තුළින් පෙන්නුම් කරනු ලබන බව කියනු ලැබේ.

පහළ ආදායම් සහිත ජන ප්‍රජාවන් හා ප්‍රාදේශීය පාසැල්ද විශේෂ කොටගෙන අධ්‍යාපනය ලබාගැනීම සඳහා සිසුන්ට ඇති ප්‍රවේශයට අර්බුදය මගින් බලපෑම් එල්ලකොට ඇති ආකාරය පිළිබඳ ජන ප්‍රජාවන් විසින් අදහස් දක්වන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සිසුන් විසින් ජීවන අරගලයෙහි නිරත සිය පවුල්වලට සහාය පිණිස රැකියා මාර්ග සොයායන බැවින් පාසැල් හැරයන්නන් සංඛ්‍යාව වර්ධනය වෙමින් පවතී. ආහාර සහනාධාර හා මාර්ගගත අධ්‍යාපනය සඳහා තාක්ෂණ ප්‍රවේශ අවස්ථා වැනි සහායන් රජය විසින් සැපයිය යුතුව පවතී.

ආහාර හා සෙසු අත්‍යවශ්‍ය ද්‍රව්‍යයනට අදාළ පිරිවැය හා සමගාමීව සිය වේතනයන්හි වර්ධනයක් සිදු නොවන බැවින් වේගවත්ව ඉහළ නගින් ආහාර හා සෙසු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පිරිවැය දරාගත නොහැකිවීම සම්බන්ධයෙන් උතුරු, නැගෙනහිර හා උඩරට ජන ප්‍රජාවන් විසින් අදහස් දක්වන ලදී. මෙමගින් බොහෝ පුද්ගලයන්ගේ ආහාර රටාවටද බලපෑම් එල්ලවී ඇති අතර, මේවන විට ඔවුහු දිනකට ආහාර වේල් තුනක් ලබාගත නොහැකි තත්ත්වයක පසුවෙති. මාළු, කුකුල් මස් හා එළවළු වැනි ප්‍රෝටීන්, විටමින්, ඛනිජලවණ ආදිය බහුල ආහාර හිඟ සහ / හෝ මිල අධික තත්ත්වයක් පවත්නා බැවින් පරිභෝජනයට ගන්නා ආහාරද පෝෂණයෙන් හීන ආහාර වේ. නව මව්වරු හා ළදරුවෝ මෙම තත්ත්වයෙහි බරපතලම වින්දිතයෝ වෙති. ආහාර සුරක්ෂිතතා ක්ෂණික ඇමතුම් අංකයක් ස්ථාපනය කළ යුතු බවටද ඇතැම්හු යෝජනා කළහ.

මූලික ජීවිකා යටිතල පහසුකම් සඳහා අවශ්‍ය මූල්‍යකරණය පිණිස ලබාගත් ණය ආපසු ගෙවීමේ දුෂ්කරතාවය පිළිබඳ බොහෝ ජන ප්‍රජාවන් විසින් අදහස් දක්වන ලදී. කුටුම්බයේ බොහෝ පුරුෂ පක්ෂ සාමාජිකයන් වෙත සිය ජීවන වෘත්තීන් අහිමිවන තත්ත්වයක, වෙනත් පුද්ගලයන්ගේ නිවෙස් රැකබලා ගැනීම, තණකොළ කැපීම හා සෙසු අත්වැඩ වැනි දෛනික වේතන ලබන කම්කරු වෘත්තීන්හි බොහෝකොට නියැළි කාන්තාවෝ පවුලේ එකම බත සපයන්නා බවටද පත් වූහ.

ආහාර හිඟතාවය හා වර්ධිත ජීවිකා වෘත්ති පීඩනයනට ප්‍රතිචාරීව විස්තෘත පවුල් සමග එක්ව ජීවත්වීම; එක්ව ආහාර පිසීම හා දුගී පවුල් සමගින් ආහාර බෙදාහදා ගැනීම වැනි ජන ප්‍රජාවන් එක්ව ජීවත්වීමේ ස්වරූපයක් ඉස්මතුව ඇති බව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලද බොහෝ පුද්ගලයෝ පැවසූහ. උඩරට ප්‍රදේශයේ හරිතාගාර වගාව හා ගෙවතු වගාව වැනි සාමූහික, සුළු පරිමාණ ව්‍යාපාරික ව්‍යවසායන් ක්‍රියාත්මක අවස්ථාවන් පිළිබඳ තොරතුරු ප්‍රකාශ විය. වඩා හොඳ වේතනයක් ඉල්ලා සිටිමින් වැඩ වර්ජනය කරමින් යම්කිසි එකඟතාවයකට එළැඹීමට වතු කළමනාකාරිත්වයට බලපෑම් කළ සාර්ථකත්ව අවස්ථාවන් මස්කෙලිය වතු කම්කරුවන් විසින් ගෙනහැර දක්වන ලදී. ප්‍රදේශයේ කාන්තාවක් ඇයට එරෙහිව ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක් විසින් ගොනුකොට තිබූ නඩුවකින් ජයග්‍රහණය කළ ආකාරය පිළිබඳ කථාවක් හිඟුරක්ගොඩින් වාර්තා විය.

පේදුරු තුඩුවේ අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් අතර ධීවර ජන ප්‍රජාවන් හා මුලතිව්හි ජන ප්‍රජාවන් විසින් ප්‍රකාශ කරන ලද්දේ ආර්ථික අර්බුදය විසින් ඔවුන්ගේ ජීවිකාවනට බාධා සිදුකරන ලද බවයි. වගා කටයුතු සඳහා අවශ්‍ය ඩීසල් හා පොහොර හිඟතාවය හේතුකොට තම ජන ප්‍රජාව තුළ බහුතරයක් පිරිස සත්ව පාලනයට සීමාවී ඇති ආකාරය උතුරු පළාතේ හා උඩරට ගොවි ජන ප්‍රජාවන් විසින් හෙළිදරව් කරන ලදී. ඉහළ ඉන්ධන පිරිවැය හේතුකොට දුෂ්කර වූද, නිෂ්පාදන මිල මගින් පූරණය කළ නොහැක්කාවූද මිනිස් ශ්‍රමය හරහා බොහෝ වගා කටයුතු සිදුකරනු ලැබීමට සිදුවූ ආකාරය හිඟුරක්ගොඩ හා පොළොන්නරුව ගොවීහු පෙන්වා දුන්හ.ූසෘ කේත ඉන්ධන කෝටාව සඳහා සිය වගා ට්‍රැක්ටර් රථ ලියාපදිංචි කිරීමේදී දුෂ්කරතාවයනට මුහුණ පෑමට සිදුවූ ආකාරය පිළිබඳ තවත් ඇතැම් ගොවීහු අදහස් දැක්වූහ.




GRENADE.HAND
ඉතිහාසය - 10 වන ශ්‍රේණිය
BOY
SRI LANKA




# වත්මන් අර්බුදය හා අරගලය සම්බන්ධ නිරීක්ෂණ

ශ්‍රී ලංකාවේ සිදුවෙමින් පැවති අරගලයේ කැපී පෙනෙන එක් පැතිකඩක් වූයේ දේශපාලන ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ ගැඹුරු ඌණතාවයක් පැවතීමයි. දිනකට එක් ආහාර වේලකින් පමණක් සෑහීමකට පත්වන්නට සිදුවීමේ සිට ආහාර පිසීමට ගෑස් ලබාගැනීම සඳහා දින ගණන් පෝලිම්වල රැඳී සිටීමට සිදුවීම දක්වා ජනතාව විසින් මුහුණ දෙන අතිශය දුෂ්කර තත්ත්වයන් පැවතියදී දේශපාලනඥයන් තුළ සහකම්පනයක් නොපැවති අතර, ජනතාව මත මෙම අර්බුදය මගින් ඇතිකර ඇති බලපෑම අවම කිරීම සඳහා ගතහැකි සියලු උත්සාහයන් ගන්නා බවක් නොපෙනෙන්නේය යන්න ජනතා හැඟීම විය. පටු පක්ෂ දේශපාලනයේ හානිය පිළිබඳවද සාකච්ඡාවන් ඇතිවිය. මේ හේතුකොට සුළු පිරිසකගේ අභිලාෂයන් සපුරාලමින් ඊළඟ මැතිවරණය ඉලක්ක කරගනිමින් දේශපාලනඥයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන හා ජනතාවට සහ පරිසරයටද හානිකර වූ අදූරදර්ශී ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය.

රටපුරා පැවති මහජන පාර්ලිමේන්තු සැසිවාර තුළදී ඒකරාශි කරගන්නා ලද අදහස් අතර ලද පණිවිඩය පැහැදිලි එකක් විය. අර්බුද අවස්ථාවකදී ජීවත්වීම අරගලයක් වන අතර මෙමගින් දිගු කාලීන ප්‍රතිසංස්කරණ හා රටේ සංවර්ධනය පිළිබඳ සාකච්ඡාවන් සීමා කළ හැක. නීත්‍යනුකූල රජයක් විසින් පළමුව සමාජයේ වඩාත් පීඩනයට ලක්වන්නාවූ කොටස් විශේෂ කොටගෙන ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලනු ලබන බවට වගබලාගත යුතුවේ. එබැවින් පවත්නා අර්බුදය නිරාකරණය කිරීම හා බලය ලබාගැනීමේ අභිලාෂයන් පසෙක ලා විවිධ කණ්ඩායම් ජාතියක් ලෙස එක්ව සිතමින් ඉදිරි ගමන සැලසුම් කිරීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමුවිය යුතුවේ. වත්මන් අර්බුදයේ මූල කාරණා නිරාකරණය කරනු පිණිස ජාතික නායකයන් හා රජයේ සේවකයන් අතර කාරුණික හා නිහතමානී ආකල්පයක් පවත්වාගැනීම අවශ්‍ය වේ.

මැතිවරණයන්හිදී දැනුවත්ව සිය තේරීම් සිදු කිරීමේ වගකීමක් පවත්නා බැවින් ඡන්ද දායකයන්ද මෙහි යම් මට්ටමකට වගකිව යුතු පාර්ශ්වයක් වන්නේය යන්න පුද්ගලයන් කිහිප දෙනෙකුගේ පිළිගැනීම විය. දේශපාලනික අනුග්‍රහය හේතුකොට බොහෝ ඡන්දදායකයන් බලපෑමට ලක්වන අතර මෙම දේශපාලන සංස්කෘතිය විසින් යෝග්‍යතම අපේක්ෂකයා තෝරා පත්කරගැනීමේ හැකියාව වළකාලන බැවින් එය බොහෝ කොට වත්මන් අර්බුදයට හේතුවේ. වර්තමානයේ මන්ත්‍රී ධුර දරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා පාර්ලිමේන්තුවෙන් පළවා හැරීම වත්මන් ජනතා විරෝධතාවන්හි අරමුණ ලෙස ඇතැම්හු දුටහ; තවත් අය විසින් මෙම ක්‍රම වෙනස දේශපාලන පක්ෂ ක්‍රමය අහෝසි කිරීමේ ස්වරූපයෙන් සිදුවිය යුතු බවට අදහස් පළ කළහ. කඩිනමින් මහ මැතිවරණයක් හා ජනාධිපතිවරණයක් පැවැත්වීමේ අවශ්‍යතාවයද ඉස්මතු විය. ක්‍රමයේ වෙනසක් ඇතිකළ හැකිවන ආකාරයන් කවරේ වුවද, වත්මන් අර්බුදයට විසඳුම් මෙම ක්‍රමය තුළ සොයාගත නොහැකිවන බැවින්, වත්මන් ක්‍රමය කඩිනමින් වෙනස් කළ යුතු වන්නේය යන්න පිළිබඳ ඒකමතිකත්වයක් පැවතිණි. කෙසේ වුවද, එවන් විපර්යාසයන් ස්වභාවිකව සිදුවීමේ හැකියාවක් නොමැති බැවින් ක්‍රමයේ වෙනස වෙනුවෙන් අවශ්‍ය බලපෑම සිදුකරනු පිණිස ජනතාව පෙළ ගැස්විය යුතුව පැවතිණි. සමාජ මාධ්‍ය විසින් සාමාන්‍ය පුරවැසියන් බලගන්වමින් ඔවුන් වෙත හඬක්ද, නියෝජිතායතන වෙත වේදිකාවක්ද සපයා දෙන අතර එමගින් සාමූහික වශයෙන් මහා පරිමාණයේ වෙනස්වීම් හා විපර්යාසයන් උදෙසා වූ ගතිකත්වය සපයන බැවින් මෙම කර්තව්‍යය උදෙසා සමාජ මාධ්‍ය ප්‍රයෝජනවත් මෙවලමක් ලෙස සැලකිල්ලට ගන්නා ලදී.




සිය සිතිවිලි හා දකුණේ සිදුවන ජනතා විරෝධතාවයන් පිළිබඳ සිය හැඟීම් කවරේද යන්න පිළිබඳ අදහස් දක්වන ලෙස උතුරු පළාතේ ජන ප්‍රජාවන් වෙතින් ඉල්ලා සිටි විටදී, සිවිල් යුද සමයේ හෝ ඉන් අනතුරුව හෝ දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සිංහල බහුතරයක් විසින් සටන් නොකරන ලද්දේය යන හැඟීමක් පැවති බව නිරීක්ෂණය විය. උතුරු හා නැගෙනහිර පළාත් විශේෂ කොටගෙන දෙමළ ජනතාව විසින් දශක ගණනාවක් පුරා අත්විඳි දුෂ්කරතාවයන් මේවන විට සිංහල බහුතරයකටද අත් විඳීමට සිදුව පැවතීම අවාසනාවන්ත තත්ත්වයක් වන නමුදු එය අවම වශයෙන් පොදු අත්දැකීමක් හා පොදු වැටහීමක් ඇතිකර ගැනීමේ අවස්ථාවක් වන්නේය යන්න ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී. ගෑස් හා විදුලි හිඟතාවයන් වැනි මෙම රළු තත්ත්වයන් යුද සමය තුළ අත්විඳින ලදුව, වත්මන් දුෂ්කරතා ඔවුන් හට අලුත් අත්දැකීම් නොවීය. යුද බලපෑමට ලක්වූ මෙම ප්‍රදේශයන්හි තරුණයන් විශේෂ කොටගත් ජන ප්‍රජාවන් වෙත අතිරේක සහායන් ලබාදීම රජයේ වගකීම වන්නේය යන්න ඔවුන්ගේ තර්කය විය.

ඉඩම් ගැටලු, හමුදාකරණය, නිවාස, ඉන්දීය බොටම් ට්‍රෝලර් යාත්‍රා මගින් සිය ධීවර ප්‍රදේශයනට ඇතුළුවීම් ඈ සිය ප්‍රදේශ හා ජන ප්‍රජාවනට අදාළ ගැටලු මෙම විරෝධතාවයන් තුළ ප්‍රමාණවත් පරිදි කේන්ද්‍රගත නොකෙරෙන බැවින් ගාලු මුවදොර පිටියේ සිදුවන විරෝධතාවනට සහභාගි වීමේ අවශ්‍යතාවයක් ඔවුනට නොතිබි බව ඇතැමුන් විසින් පැහැදිලි කරන ලදී. බොහෝ කලෙක පටන් උතුරු පළාතේ ජනතාවට සීමා සහිතව පැවති ආහාර, විදුලිය හා සෙසු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා සේවාවන් ලබාගැනීම උදෙසා දැන් දකුණේ විරෝධතාකරුවන් විසින් සටන් කරමින් සිටි බව ඔවුහු පැවසූහ. එබැවින් උතුරේ හා දකුණේ ජනතාවගේ අරගලයන් මූලික වෙනස්කම්වලින් යුක්ත වන්නේය යන්න ඔවුන්ගේ හැඟීම විය.

රාජපක්ෂ රජය බලයට ගෙනඒම සඳහා සිය ඡන්දය පාවිච්චි කිරීමෙන් දකුණේ ජනතාව තමා වෙත කැන්දාගෙන ආ ගැටලුවකට ප්‍රතිචාරී ලෙස ජන විරෝධතාවයන් සිදුවන්නේය යන්න තවත් පිරිසකගේ අදහස විය. උතුරේ රාජ්‍ය භීෂණයට අදාළ ඓතිහාසික අත්දැකීම් හේතුකොට මෙහි සියලු දෙනා සාමකාමී විරෝධතා හරහා විමුක්තිය හා යුක්තිය සාක්ෂාත් කරගත හැකි බවක් විශ්වාස නොකරන්නේය යන මතය දැරූ පිරිසක්ද විය. අතීතයේදී දකුණේ විමුක්ති ව්‍යාපාරයන්ද රජය විසින් පරාජය කිරීම හෝ සිය ප්‍රයෝජනය පිණිසම යොදාගැනීම සිදුවූ අතර, වර්තමානයේදී මෙයට වඩා වෙනස් ප්‍රතිඵලයක් අත්වීමට හේතුවක් නොමැත්තේය යන්න ඔවුන්ගේ අදහස විය.





නිදහස උදෙසා තමා විසින් දිගු කලක් පුරා ඉදිරියට ගෙනයන ලද අරගලයෙන් ඇතිවූ වෙහෙස හා එහි නිර්රථකභාවය පිළිබඳ බොහෝ පුද්ගලයෝ අදහස් පළ කළහ. ඓතිහාසිකව හා වර්තමානයේ පවා විරෝධතා දැක්වීමේ බර දරා සිටින ලදුව, සිය පාර්ශ්වයන් මෙම විරෝධතාවයනට සම්බන්ධ වූයේ නම් දකුණ මේවන විට අත්විඳින මර්දනය ඉක්මවූ රාජ්‍ය මර්දනයකට මුහුණ දීමට තමාට සිදුවනු ඇත්තේය යන්න උතුරේ බොහෝ දෙනාගේ අදහස විය. පොදුජන විරෝධතාවයන් මතින් බලයට පැමිණෙන කවර පාර්ශ්වයක් විසින් හෝ (උතුරේ ජනතාව වන) තමා හට මෙයට වඩා වෙනස් අයුරකින් තමා දැනට පත්ව ඇති තත්ත්වය වෙනස් කිරීමේ අදහසින් කටයුතු කරනු ඇත්තේය යන්න පිළිබඳව ඔවුන් තුළ එතරම් විශ්වාසයක් නොපැවතිණි.


එසේ වුවද, තමා (හිටපු) ජනපති ගෝඨාභය රාජපක්ෂ චරිතය තුළ පොදු සතුරෙකු දුටු බැවින් අවසානයේදී සිය ගැටලුද මෙම ව්‍යාපාරයන් තුළ ඉස්මතුවනු ඇත්තේය යන අපේක්ෂාව පෙරදැරිව ගොඨාගෝගම විරෝධතාවයන් සාර්ථක වේවාය යනුවෙන් ප්‍රාර්ථනා කළ බව මෙම ප්‍රදේශයන්හි කිහිප දෙනෙකු විසින් ප්‍රකාශ කරන ලදී. මැයි 9වන දින විරෝධතා පැවැත්වූ ස්ථානවලට පහර දුන්නේය යන පුවත ඇසීමෙන් තමා කණගාටුවට පත්වූ බව ඇතැම්හු ප්‍රකාශ කළහ. යාපනය විශ්වවිද්‍යාලය ගිනි තැබීම හා බලහත්කාරී අතුරුදන් කරවීම් වැනි සිය ජන ප්‍රජාවන් වෙත එල්ල කරන ලද රාජ්‍ය අසාධාරණයන් පිළිබඳව ක්‍රියාකාරීන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් ශ්‍රවණය කළ ආකාරය තවත් පිරිස් විසින් පෙන්වා දෙන ලදී. බලතල සහිත තනතුරුවලට පත්වූ පසු සැබෑ වෙනසක් ඇති කිරීමට හැකිවනු පිණිස ජනතා අරගලයේ ඉදිරි පෙළ නියමුවන් වන තරුණයන් උතුරට පැමිණ සිය ගැටලු පිළිබඳ වඩා ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම යෝග්‍ය බවට ඔවුන් විසින් යෝජනා කරන ලදී.

ජනතාවක් ලෙස විරෝධතාකරුවන් විසින් සිය අයිතිවාසිකම් වෙනුවෙන් අරගල කරන අකාරය දැකීමෙන් ඇතිවූ ආඩම්බරය මුසු හැඟීම පිළිබඳ හිඟුරක්ගොඩ, පොළොන්නරුව ප්‍රදේශයන්හි ඇතැම් ජන ප්‍රජාවන් විසින් අදහස් දක්වන ලදී.

උඩරට ප්‍රදේශයේද ජනතාව විසින් ප්‍රශ්න කරන ලද්දේ වතු කම්කරුවන්ගේ වේතනයන් ප්‍රමාණවත් නොවීම වැනි ආර්ථික හා සමාජ ගැටලු පිළිබඳ ඔවුන් විසින් සිදුකරනු ලබන නිරන්තර විරෝධතාවයනට දකුණේ සිදුවන විරෝධතාවයනට සමාන මාධ්‍ය ආවරණයක් නොලැබෙනුයේ මන්ද යන්නයි. වැවිලි අංශය දැඩිසේ පොහොර මත රඳා පවත්නා බැවින් 2021 වසරේ රජයේ රසායනික පොහොර තහනමට පළමු කොට විරෝධතාවයන් ඉස්මතු කරන ලද්දේ මෙම ප්‍රදේශයන්හිය යන කරුණ ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී. කෙසේ වුවද එම විරෝධතාවයනට ලබාදෙන ලද්දේ සුළු මාධ්‍ය ආවරණයක් පමණි.

ඉඩම් ගැටලු සම්බන්ධ කරුණු වැනි කරුණු සම්බන්ධයෙන් සිය විරෝධතාවයන් හඬ නඟනු පිණිස (උඩරට) එම පිරිසෙන් ඇතැම්හු කොළඹ (ගාලු මුවදොර) වෙතද ගමන් කළහ.

උඩු පුස්සැල්ලාව වතු කම්කරු වෘත්තිය වැනි දැනටමත් නිෂ්කර්ශක ජීවනෝපායන් මත රඳා පවත්නා ආර්ථික වශයෙන් අඩමාන ජන ප්‍රජාවන් විසින් විරෝධතාවන්හි නියැළුණහොත් දවසේ ආදායම අහිමි වීමේ හෝ සමස්ත රැකියාවම පවා අහිමි වීමේ අවදානම පිළිබඳ බියට පත්ව සිටි ආකාරය සම්බන්ධයෙන් කරුණු දක්වන ලදී. නිදසුනක් ලෙස, කම්කරු හිමිකම්වලට අදාළ ඇතැම් ගැටලුවලට එරෙහිව හඬ නැඟීම හේතුවෙන් තම පිරිසෙහි ඇතැමුන් වෙත දඬුවම් පමුණුවන ලද අතර මෙය විරෝධතා දක්වන පුද්ගලයාගේ/ පුද්ගලයන්ගේ කුලය හෝ වතු කළමනාකාරිත්වය සතු පක්ෂ හා / හෝ වෘත්තීය සමිති සබඳතා මගින් තීරණය වන ආකාරයද සම්බන්ධයෙන් මත්තෙකැලේ වතු කම්කරුවන් විසින් අදහස් දක්වන ලදී. දේශපාලනඥයන් ජනතා බදු මුදලින් වැටුප් ලබන රජයේ සේවකයන් ලෙස කටයුතු කරන අතර ඔවුන්ද නීතියට ඉහළින් හෝ ඔවුන් බලයට පත්කළ ජනතාවට වඩා උසස් තත්ත්වයක පසු නොවන්නේය යන සාමාන්‍ය දැනුවත්භාවයක අවශ්‍යතාවයද ඔවුන් විසින් පෙන්වා දෙන ලදී. ජනතාව විසින් සිය බලය ආපසු ලබාගත යුත්තේය යන්න ඔවුන්ගේ අදහස විය. හුදෙක් තනතුරින් ඉල්ලා අස්වීමට වඩා වගවීමක් හා යුක්තිය ඉටු කිරීමක් අවශ්‍ය වූ බැවින් 'ගෝඨා ගෙදර යනු' යන සටන් පාඨය වෙනුවට 'ගෝඨාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන එනු' යන සටන් පාඨය ඉදිරියට ගත යුතුව පැවතියේය යන්නට අදහස් ඉදිරිපත් විය. දැනට පවත්නා දේශපාලන සංස්කෘතිය හා විධිමත් දේශපාලනයේ පවත්නා කීර්තිය දුර්වල එකක් වීම තුළ රාජ්‍ය සේවයට දක්ෂතා සහිත හා අවංක පුද්ගලයන් ඇතුළු වීම අධෛර්යමත් කරවනු ලබයි.






වත්මන් අර්බුදය සිය සමාජ හා සංස්කෘතික ජීවිතවලට බලපෑම් සිදුකළ ආකාරය පිළිබඳ බොහෝ ජන ප්‍රජාවන් විසින් අදහස් දක්වන ලදී. නිදසුනක් ලෙස, එදා වේල සරිකර ගන්නා සුළු ජීවන ක්‍රමය හේතුකොට තෘප්තිමත් හා සමබර ජීවිතයකට අවශ්‍ය වන්නාවූ සමාජ සංස්කෘතික හා ආගමික පිළිවෙත්හි නියැළීමට තමාට කාලයක් හෝ නිදහසක් නොපැවති බවට බොහෝ පිරිසක් විසින් අදහස් දක්වන ලදී. අවශ්‍ය අවස්ථාවන්හිදී එකිනෙකා වෙත උපකාර කරගැනීම සම්ප්‍රදාය වුවද වත්මන් අර්බුදය විසින් සියලු දෙනා වෙත කෙතරම් අයහපත් බලපෑමක් එල්ල කොට ඇත්තේද යත් කිසිවෙකු හට හෝ සෙසු අයගේ අවශ්‍යතාවයනට උපකාර කිරීමට තරම් හැකියාවක් නොතිබි ආකාරය පිළිබඳවද අදහස් පළ විය. නුදුරු අනාගතයේදීම ආර්ථික සහනයක් ලබා නොදුනහොත් විදෙස්ගත ශ්‍රමිකයන් බවට පත්වීම සඳහා විදේශ ගතවීම හෝ අවම වශයෙන් ජීවත් වීමේ මං අතිශයින්ම අවහිර වී ඇති සිය ගම්බිම් හැරයාම වැනි ජීවිතය පවත්වාගෙන යාමේ විකල්ප විධික්‍රම සොයාග ැනීමට ජනතාවට බල කෙරෙනු ඇති බව ප්‍රකාශ විය. එවන් බිඳ වැටීම්හි සමාජ පිරිවැය අතිශයින් ඉහළ අගයක් ගනී.

LAW & SOCIETY TRUST
නීතිය සහ සමාජ භාරය
3, කින්සි ටෙරසය,
කොළඹ 08,
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (0) 11 268 48 45
ෆැක්ස්:+94 (0) 112 268 68 43
වෙබ්: **www.lstlanka.org**